276

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**කළමනාකරණ අධ්‍යයන පීඨය**
**ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් සහතික පත්‍ර පාඨමාලාව**
**දෙවන මට්ටම**
**OSC2402: කුඩා ව්‍යාපාර කළමනාකරණය**
**අවසාන පරීක්ෂණය – 2023/2024**

**කාලය – පැය දෙක (02) යි**

---

**දිනය: 2024 අගෝස්තු 17** **වේලාව: ප. ව. 01.30 – ප. ව. 03.30**

---

**උපදෙස් :**

- **ඕනෑම ප්‍රශ්න හතරක් (04) සඳහා පිළිතුරු සපයන්න.**
- **සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.**

1. (අ) "කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (Small and Medium Enterprise-SME) අංශය රටක ආර්ථිකය තුල ප්‍රධාන භූමිකාවක් රඟ දක්වයි." මෙම ප්‍රකාශය සුදුසු උදාහරණ සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

   (ආ) තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සෑම විටම අවදානම් සහගත වේ. එනමුත්, වත්මන් තරුණ පරපුර වෙනත් කෙනෙකු යටතේ රැකියාවක් කිරීමට වඩා තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වයි. අවදානම් සහගත වුවත් පුද්ගලයකු තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පොළඹවන හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 15)

2. ඔබගේ මිතුරකු තම ප්‍රාග්ධනය යොදමින් නව කුඩා ව්‍යාපාරයක් ආරම්භකර එයට සේවකයන් 15 දෙනෙකු බඳවා ගෙන ඇති බව උපකල්පනය කරන්න. ඔබ කුඩා ව්‍යාපාර කළමනාකරණය අධ්‍යයනය කර ඇති නිසා ඔබගේ මිතුරා තම ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට ඔබගේ උපදෙස් පතයි. ඔබගේ මිතුරාට ඔබ ලබාදෙන උපදෙස් මොනවාද?

   ඔබ ලබාදෙන උපදෙස් අවම වශයෙන් ඉහත ව්‍යාපාරයේ වැදගත් අංශ හතරක් (04) ආවරණය කළ යුතු වන අතර එම උපදෙස් සඳහා හේතු දැක්වීමද අවශ්‍ය වේ. (ලකුණු 25)

3. (අ) ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සසඳන විට ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මුහුණ පාන අභියෝග මොනවාද? උදාහරණ සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) ලෝකයේ සිදුවන තාක්ෂණික සංවර්ධනයන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යවසායයන්ට ඔවුන්ගේ ව්‍යාපාර ව්‍යාප්ත කර ගැනීම සඳහා ලැබී ඇති අවස්ථාවන් (opportunities) සැබෑ ලෝකයෙන් උදාහරණ දක්වමින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

4. (අ) හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) දක්වා ඇති පරිදි කළමනාකරුවකුගේ ප්‍රධාන භූමිකාවන් (roles) තුන (03) උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) ඔබ ඉහත සඳහන් කළ භූමිකාවන් සාර්ථකව ඉටු කිරීමට කළමනාකරුවකු ලෙස ඔබ සතුවිය යුතු කුසලතා (skills) මොනවාද? සාකච්ඡා කරන්න. (ලකුණු 15)

5. (අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් සඳහා සැලසුම්කරණයේ (Planning) වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) "කුඩා ව්‍යාපාරයක් සතුව මනාව සකසන ලද සැලැස්මක් තිබේනම්, අනෙකුත් කළමනාකරණ ශ්‍රිතයන් (management functions) පිළිබඳ අවධානය යොමු කිරීමට අවශ්‍ය නොවේ."
ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 15)

**- සියලු හිමිකම් ඇවිරිණි -**